සති අග අරුණ (10/18) පුවත්පතේ "මන්දමානසික කාන්තාවක් රාජ්‍ය සේවයට?" යන සිරස්තලයෙන් යුතුව වාර්තා කෙරී තිබූ දිවි අහිමි කරගැනීමක පුවතකි. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ඔස්සේ කතිකාවක් ඇතිව තිබූ අතර, එය අසංවේදී පුවත් වාර්තාවක් වීම ඔස්සේ Ethics Eye වෙතද යොමු කෙරී තිබිණි.

මෙම පුවත සම්බන්ධයෙන් වන නිරීක්ෂණයන් පහත පරිදි පෙළගස්වමු.

1) මෙම පුවත් වාර්තාව ලියැවී ඇති ආකාරය මත පදනම්ව බලන කළ, එය අසංවේදී යැයි ඔබ සිතන්නේද? ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

2) දිවි අහිමි කරගැනීමේ පුවතක් ඉදිරිපත් කිරීමේදී, එම දිවි අහිමි කරගත් ආකාරය නොදැක්විය යුතු බව ඒ පිළිබඳව වන මාධ්‍ය ආචාර ධර්මයන් තුළ දැක්වේ. (මෙම පෝස්ටුව තුළ, පුවත් වාර්තාවේ අන්තර්ගතයේ සඳහන් එම දිවි අහිමි කරගත් ආකාරය එලෙසින්ම දක්වා ඇත්තේ, මෙම පුවත් වාර්තාවේ ස්වරය පිළිබඳව සඳහන් කිරීමට එය අවශ්‍ය බැවින් බව සලකන්න).

3) දිවි අහිමි කරගැනීමක් පිළිබඳ පුවතක් ඉදිරිපත් කිරීමේදී උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය වේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna**